**බේරුවල ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

---------------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 24 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 19 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට බේරුවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1:3:1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------

2010 ජනවාරි 19 උනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 54 අනුව සියළුම පළාත් පාලන ආයතන විසින් තම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගනිමින් සකස් කළ යුතු වුවත් සභාව විසින් එසේ කර නොතිබුණි.

1:3:2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා සභාව විසින් අනුගමනය කර තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ කර්මාන්ත ණයහිමියන් සඳහා ගෙවා තිබූ රු.642,961 ක් කර්මාන්ත ණයහිමි ගිණුමට ගිණුම් ගත නොකර වැය ගිණුමට ගිණුම් ගත කර තිබීමෙන් සිදු වී තිබූ වරද නිවැරදි කිරීමට ණයහිමි ගිණුම හර කර සමාලෝචිත වර්ෂයේ වැය ගිණුම බැර කළ යුතු වුවත් සමාලේචිත වර්ෂයේදී සමුච්චිත අරමුදල හර කර ණයහිමි ගිණුම බැර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ලිපිද්‍රව්‍ය ගබඩා තොග ලෙජරයේ අයිතමයන් 06 ක රු.223,450 ක තොග ශේෂයක් පැවතුණද, තොග උපලේඛනයට අනුව එකී අයිතමයන්ගේ ශේෂය රු.147,600 ක් වීමෙන් පොදු ගබඩා නිකුත් කිරීම් රු.75,850 ක් වැඩියෙන්ද, ගබඩා ශේෂය එම වටිනාකමින් අඩුවෙන්ද දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් රු.47,148,535 ක් ලැබී තිබුණද වැටුප් ප්‍රතිපූර්ණ බිල් කිරීම් ලෙස රු.67,907,003 ක් ගිණුම් ගත කර තිබීම නිසා වර්ෂයේ ආදායම හා ලැබිය යුතු වැටුප් ප්‍රතපූර්ණ ගිණුමේ ශේෂය රු.20,758,468 කින් වැඩියෙන් දැක්විණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට විදුලි ගබඩා තොග ලෙජරයේ MV චෝක් සඳහා රු.25,740 ක ශේෂයක් තබුණද, තොග උපලේඛනයේ ඒ සඳහා රු.5,940 ක ශේෂයක් දැක්වීමෙන් විදුලි ගබඩා නිකුත් කිරීම් රු.19,800 ක් වැඩියෙන්ද, විදුලි ගබඩා තොග ශේෂය එම වටිනාකමින් අඩුවෙන්ද දැක්විණි.

(ඉ) පළාත් පාලන කොමසාරිස් විසින් වැටුප් ප්‍රතිපූර්ණ මගින් අයකර ගැනීමේ පදනම මත සභාවට ලබා දී තබූ රු.3,178,456 ක් වූ කැබ් රථය සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ රු.706,272 ක ණය වාරික ප්‍රාග්ධන වැය ගිණුමට හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කළ යුතු වුවත් කැබ් රථයේ සම්පූර්ණ වටිනාකම ප්‍රාග්ධන වැය ගිණුම හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණම බැර කර තිබීම නිසා එම ගිණුම් දෙකේ ශේෂයන් රු.2,472,184 කින් වැඩියෙන් දැක්විණි.

## 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 127,861,170 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.66,345,982 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,901,837 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 15,488 | 9,826 | 11,302 |
| (ii.) | බදු කුලී | 13,409 | 10,800 | 3,758 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 1,682 | 1,654 | 28 |
| (iv.) | වෙනත් ආදායම් | 45,000 | 32,371 | 19,068 |

2:2:2 වර්පනම් බදු
--------------

2013 ඔක්තෝබර් 30 දිනට රු.7,543,992 ක වරිපනම් බදු හිඟව පැවතුණි. එම ශේෂයෙන් අවුරුදු 5 ට ව ැඩි කාලයක සිට පැවත එන හිඟ ශේෂය රු.1,023,731 ක්ද, අවු. 01 ත් 05 ත් අතර ශේෂය රු.6,314,340 ක් ද විය.

2:2:3 **කඩකුලී**

(අ) මග්ගොන පොදු වෙළඳපොල කඩ කාමර 04 කින් මාස 5 සිට 12 දක්වා කාල පරාසයකට අදාල හිඟ කුලී රු.11,850 ක්ද පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 18 කින් මාස 03 සිට 10 දක්වා කාල පරාසයකට අදාල හිඟ කුලී රු.239,200 ක්ද 2013 ඔක්තෝබර් 31 වන විටත් හිඟව පැවතුණි.

(ආ) මිල ගණන් ලැබී නොතිබූ එළවළු වෙළඳසැල් 8 ක් සඳහා නැවත ටෙන්ඩර් කිරීමට විගණිත දිනය වූ 2013 නොවැම්බර් 07 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) සතිපොලෙහි පැරණි කඩ කාමර අංක 06 හා නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 8 ක් 2012 ජූලි 31 දින සභාවට පවරාගෙන තිබූ නමුත් විගණිත දිනය වූ 2013 නොවැම්බර් 07 වන විටත් ඒවා උපයෝජනයකින් තොරව පැවතුණි.

(ඈ) 2002, 2003 හා 2007 වර්ෂවල ගිවිසුම් අවලංගු වී තිබූ පයාගල උප කාර්යාලයේ මග්ගොන පොදු වෙළඳපොල කඩ කාමර 3 ක හා කුඩා පයාගල මාළු වෙළඳසැළක ගිවිසුම් අළුත් කිරීමට විගණිත දිනය වූ 2013 නොවැම්බර් 07 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
--------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 16,439,536 |
| (ii) | මුද්දර ගාස්තු | 29,728,986 |

2:3 ආර්ථික නොවූ ගනුදෙනු
--------------------------

කුණු තුනී කිරීමේ කාර්යය සඳහා කුලී පදනම මත වේන් ලෝඩරයක් ලබා ගැනීම සඳහා සභාව විසින් 2010 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා රු.8,192,000 ක් ගෙවා තිබූ අතර වේන් ලෝඩරයක් ණය පදනම මත හෝ මිලදී ගැනීමට ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. එසේ වුවද, සභාව විසින් නව මාර්ග තලන යන්ත්‍රයක් රු.9,016,253 කට 2013 ජූලි 23 දින මිලදී ගෙන තිබුණි. මාර්ග තලන යන්ත්‍රයක් සභාව සතුව තිබියදී නව මාර්ග තලනයක් මිලදී ගැනීම තුළින් වේන් ලෝඩරයක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය නොසළකා හැර තිබූණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

3.1 කොන්ත්‍රාත් පර්පාලනය
--------------------------

(අ) 2013 මහ නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීම සඳහා වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වෙතින් රු.22,573,000 ක ප්‍රතිපාදන අනුමත වී තිබූ මාර්ග ව්‍යාපෘති 30 ක් 2014 ජනවාරි 17 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2013 නොවැම්බර් 08 දින සභාවේ කාර්මික නිලධාරිනිය සමඟ සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මිනව්වි කන්ද මාර්ගය අදියර 2 ක් යටතේ දිග මීටර් 98.4 ක් ද, ඉලංකන්ද ළදරු පාසල ඉදිරිපිට මාර්ගය දිග මීටර් 87.5 ක් ද කොන්ක්‍රට් අතුරා ප්‍රතිසංස්කරණය කර තිබූ නමුත් එක් එක් අදියරෙහිදී ප්‍රතිසංස්කරණය කරන ලද කොටස නිශ්චිතව හඳුනාගැනීමට හැකිවන ලෙස මාර්ග සැළැස්මක් සකස් කර නොතිබූ බැවින් සභාව විසින් ප්‍රතිසංස්කරණය කරන ලද කොටස නිශ්චිතව හඳුනාගැනීමට අපහසු විය.

3.2 කළමනාකරණ අකර්යක්ෂමතා
---------------------------------

(අ) <u>**අත්තිකාරම් ගෙවීම්**</u>

2008 සිට 2012 දක්වා ලබා දී තිබූ රු.479,625 ක අත්තිකාරම් විගණිත දිනය වූ 2014 මැයි 13 වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **ජල නල එළීම**
---------------

අළුත්ගම පූර්වාරාම මාර්ගයේ දුම්රිය හරස් මාර්ගය අසල ජල නල එළීම සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් පළුදු කර තිබූ මාර්ගය නැවත ප්‍රතිසංස්කරණය සඳහා රු.400,000 ක වැය ඇස්තමේන්තුවක් 2013 මාර්තු 15 දින සභාව විසින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත යවා තිබූ නමුත් එම මුදල් සභාව වෙත ගෙන්වා ගෙන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට විගණිත දිනය වූ 2013 නොවැම්බර් 08 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) <u>වාහන පාලනය</u>

(i) සභාව සතු වාහන 11 ක දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබූ අතර එකී වාහන වලට ඉන්ධන ඇණවුම් නිර්දේශ කර රු.3,551,770 ක් වූ ඉන්ධන නිකුත් කර තිබුණි.

(ii) කැබ් රථයක් සම්පූර්ණ අළුත්වැඩියාවක් සිදු කිරීම සඳහා 2013 අගෝස්තු 19 දින ඉල්ලුම් කර එදිනම ඒ සඳහා අනුමැතිය ලැබී තිබියදී එදිනම ගියර් බොක්ස් අළුත්වැඩියාවක් සඳහා රු.101,788 ක් වැය කර තිබුණි. 2013 නොවැම්බර් 08 දින වන විටත් එම රථය අළුත්වැඩියා කර නැවත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි .

(iii) වාහන සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(iv) සභාව සතු කිසිදු වාහනයක් සම්බන්ධයෙන් ලොග් පොත් නිසි පරිදි නඩත්තු කර නොතිබුණි.

(v) වාහන අළුත්වැඩියා කිරීමේදී හෝ අමතර කොටස් සවි කිරීමේදී ඉවත් කරනු ලබන අමතර කොටස් උපකරණ,මෙවලම් සම්බන්ධ විස්තර දක්වමින් උපලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

3.3 **වත්කම් කළමනාකරණය**

(අ) 2013 පෙබරවාරි 28 දින මිලදී ගෙන තිබූ රු.300,000 ක් වටිනා ට්‍රේලරය හා 2013 ජූලි 23 දින මිලදී ගෙන තිබූ රු.9,016,253 ක් වටිනා මාර්ග තලන යන්ත්‍රය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 203 හා 217 අනුව සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණයක් සහ ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් විගණිත දිනය වූ 2013 නොවැම්බර් 08 වන විටත් පවත්වා නොතිබුණි.

(ඇ) කැඩී අක්‍රියව පැවති ජායා පිටපත් යන්ත්‍රයක්, රෝනියෝ යන්ත්‍රයක්, ෆැක්ස් යන්ත්‍රයක්, ඇඟිලි සළකුණු යන්ත්‍රයක් හා යතුරුළියන 3 ක් වර්ෂ ගණනාවක සිට ගබඩාවේ දිරාපත් වෙමින් පැවතුණි.

(ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI /2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගනක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

4. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) අභ්‍යන්තර පාලනය
(iii) අයවැයකරණය
(iv) ආදායම් පරිපාලනය
(v) කොන්ත්‍රාත් පාලනය
(vi) වාහන පාලනය